17-07-2023



# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

Learning Resource Center De Mazenod College Kandana

## ඉතිහාසය

පළමු වාර පරීක්ෂණය-2023 | 08 ශ්‍රේණිය | කාලය පැය 2

• ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) වියළි කලාපය යනු කුමක්ද ?
   i. වර්ෂයේ එක් කාල පරිච්ඡේදයක පමණක් වර්ෂාව ලැබෙන ප්‍රදේශය
   ii. වර්ෂය පුරාම වැසි ලැබෙන ප්‍රදේශය
   iii. වැසි නොලැබෙන ප්‍රදේශය
   iv. අධික වැසි ලැබෙන ප්‍රදේශය

2) අභය වැව සෑදූ රජ,
   i. වසභ රජ
   ii. ධාතුසේන රජ
   iii. මහසෙන් රජ
   iv. පණ්ඩුකාභය රජ

3)" මයෙත් වැව " අද හඳුන්වන නම,
   i. මහවිලච්චිය වැව
   ii. පාදුලකවාපි වැව
   iii. මහාත්තිත වට්ටිට වැව
   iv. මහාදත්තවාපි වැව

4)වැවේ ජලය මනා පාලනයකින් පිටතට ගනු ලබන්නේ,
   i. බිසෝකොටුව
   ii. සොරොව්ව
   iii. රළපනාව
   iv. පිටවාන

5)" ලක්දිව පුරාතන වාරි මාර්ග " කෘතිය සම්පාදනය කලේ කවුද ?
   i. සෙනරත් පරණවිතාන මහතා
   ii. හෙන්රි පාකර් මහතා
   iii. ආර්. එල්. බ්‍රෝහියර් මහතා
   iv. ජෝන් ඩොයිලි මහතා

6)පොකුණු තැනීමේ අවශ්‍යතා ගණන වනුයේ,
   i. 1යි
   ii. 3යි
   iii. 2යි
   iv. 4යි

7)දුතේ කර්මාන්ත අතර ප්‍රමුඛතැන ලැබුණු කර්මාන්තය වනුයේ,
   i. යකඩ කර්මාන්තය
   ii. මැටි කර්මාන්තය
   iii. පන් කර්මාන්තය
   iv. පේෂ කර්මාන්තය

8)මධ්‍යම නුවරගම් පළාතේ ගල්කඩවල නම් ග්‍රාමයේ ගඩොල් පෝරෝණුවක් සාදා සංරක්ෂණය කළ දාගැබ වනුයේ,
   i. රුවන්වැලි මහ සෑය දාගැබ
   ii. අභයගිරි දාගැබ
   iii. ජේතවන දාගැබ
   iv. ථූපාරාමය දාගැබ

9) අතිතයේ "කබර " යන වචනය යොදනු ලැබුවේ.
   i. පිත්තල සඳහා
   ii. ලෝකඩ සඳහා
   iii. තඹ සඳහා
   iv. යකඩ සඳහා

10)" බලංගොඩ සමනල නැන ප්‍රදේශය " යකඩ නිස්සාරණය කරනු ලැබුවේ.
   i. සුළං බලයෙන්
   ii. සකපෝරුව භාවිතයෙන්
   iii. මයිනහම භාවිතයෙන්
   iv. ගල් අඟුරු භාවිතයෙන්

11) පොළොන්නරුවේ කිරිවෙහෙර දාගැබ සාදනු ලැබූ රජතුමා වන්නේ,
i. මහා පරාක්‍රමබාහු රජ
ii. මහා බුවනෙක බාහු රජ
iii. මහා විජයබාහු රජ
iv. නිශ්ශංකමල්ල රජු

12) "ආයක" යන්න හඳුන්වන තවත් නමක් වන්නේ,
i. චෛත්‍යගර
ii. වාහල්කඩ
iii. ප්‍රධානගර
iv. බෝධිඝර

13) ථූපාරාමය පිළිමගෙය අයත් වනු ලබන්නේ,
i. ගන්ධකුටි සම්ප්‍රදායටය
ii. ලෙන් විහාර සම්ප්‍රදායටය
iii. ගෙඩිගේ සම්ප්‍රදායටය
iv. ඉහත් එකකටවත් නොවේ

14) මහයාන බුද්දහමට අයත්වන ප්‍රතිමාවක් වන්නේ,
i. දඹේගොඩ බෝසත් පිළිමය
ii. උත්තර ගල්විහාර පිළිමය
iii. සමාධි බුදු පිළිමය
iv. වැලිගම සැතපෙන පිළිමය

15) පොළොන්නරුවේ චෝල, හින්දු බලපෑම මත සඳකඩපහනින් ඉවත් කරනු ලැබූ සත්වයා වනුයේ,
i. ඇතා
ii. හංසයා
iii. අශ්වයා
iv. ගවයා

16) මහනුවර රාජධානියට ආරක්ෂාව සපයන ගඟ වනුයේ,
i. මහවැලි ගඟ
ii. නිල්වලා ගඟ
iii. කැළණිගඟ
iv. කළු ගඟ

17) මහනුවර රාජධානියේ පළමු ස්වාධීන රජතුමා වන්නේ,
i. ජයවීර බණ්ඩාර රජ
ii. I විමලධර්මසූරිය රජ
iii. කරලියැද්දේ බණ්ඩාර රජ
iv. සේනා සම්මත වික්‍රමබාහු රජ

18) I වන විමලධර්මසූරිය රජතුමා සඟවා තිබූ දන්ත ධාතූන්වහන්සේ මහනුවරට වැඩමකර දළදා මාළිගාව සාදා එහි තැන්පත් කරන ලදි. එම සඟවා තිබූ විහාරය වනුයේ,
i. දෙල්ගමුව විහාරය
ii. නාගදීප විහාරය
iii. කැළණි විහාරය
iv. මහියංගන විහාරය


19) පළමු නායක්කාර් වාංශික රජතුමා වනුයේ,
i. ශ්‍රී වික්‍රමරාජසිංහ රජ
ii. කීර්ති ශ්‍රී රාජසිංහ රජ
iii. රාජාධි රාජසිංහ රජ
iv. ශ්‍රී විජය රාජසිංහ රජ

20) මහනුවර රාජධානිය ඉංග්‍රීසින් විසින් යටත් කරගනු ලැබූ වසර වනුයේ,
i. ක්‍රි.ව. 1796
ii. ක්‍රි.ව. 1815
iii. ක්‍රි.ව. 1802
iv. ක්‍රි.ව.1818

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතරින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5 කි.

**(1)** (අ)



A


i. A රූපයෙන් දැක්වෙන පොකුණෙහි නම කුමක්ද?

ii. මෙම පොකුණ දක්නට ලැබෙන්නේ කුමන ඓතිහාසික නගරයේද?

iii. පොකුණු සඳහා ස්ථාන තෝරා ගැනීමේදී වඩාත් සැලකිල්ල දැක්වූ කාරණය කුමක්ද?

iv. මෙම පොකුණෙන් ඉටුකරගත් එක් අවශ්‍යතාවයක් ලියන්න.

(ආ)



B

i. B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

ii. අනුරාධපුර යුගයට අයත් මෙම කලාත්මක නිර්මාණය හමු වූ ස්ථානය කුමක්ද?

iii. පොළොන්නරු අවධියේ හින්දු බලපෑමෙන් මේ කලාත්මක නිර්මාණයෙන් ඉවත්වූ සත්ත්වයා නම් කරන්න.

iv. B රූපයෙන් දැක්වෙන නිර්මාණය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

**(2)**

i. පහත සඳහන් වැව් කරවූ රජවරු පිළිවෙලින් නම් කරන්න.
   මින්නේරිය වැව -
   කලා වැව - ______________________

ii. විශාල වැව් තැනවීම නිසා ලාංකිකයන් ලබාගත් ජයග්‍රහණ 2ක් ලියන්න.

iii. වැවක ප්‍රධාන අංග 3ක් වන රළපනාව, අකුලුවාන, සිටවාන මගින් ඉටු වූ කාර්යභාරය විස්තර කරන්න.

(3)

i. පුරාණයේ ආරෝග්‍යශාලා පැවති බවට සාධක හමුවන ස්ථාන 2ක් නම් කරන්න.

ii. පැරණි ආගමික ගොඩනැගිලි වර්ග 4ක් ලියන්න.

iii. අපේ පැරණි මුතුන් මිත්තන් සතුව පැවති මැටි බඳුන් නිපදවීමේ තාක්ෂණය කෙටියෙන් විස්තර කරන්න.

(4)

i. ශ්‍රී ලංකාවේ ඉදිවූ මුල්ම දාගැබ හා එය ඉදිකළ රජතුමා නම් කරන්න.

ii. අග නගරයෙන් බැහැරව ඉදිවූ විශාල දාගැබ් 4ක් නම් කරන්න.

iii. රජරට ශිෂ්ටාචාරයට අයත් පහත වාස්තු විද්‍යා නිර්මාණ 2ක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
   - වේකියසර
   - බෝධිසර

(5)

i. පිළිම ගෙවල් යනු කුමක්ද?

ii. පිළිම ගෙවල් නිර්මාණය කල ප්‍රධාන සම්ප්‍රදායන් 2ක් ලියන්න.

iii. අනුරාධපුර යුගයේ නිර්මාණය වූ බුද්ධ ප්‍රතිමා ඉරියව් 3ක් ලියා ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

(6)

i. මහනුවර රාජධානිය නම් කරන තවත් නම් 2ක් ලියන්න.

ii. පහත සටන් සිදු වූ පෘතුගීසි සටන් සඳහා ප්‍රතිප්‍රහාර දුන් ලාංකික (මහනුවර) රජවරු ලියන්න.
   - දන්තුරේ සටන
   - බලන සටන
   - ගන්නෝරුව සටන
   - රන්දෙණිවල සටන

iii. පළමු වන විමලධර්මසූරිය රජු කෙටි විස්තරයක් ලියන්න.

(7)

i. මහනුවර යුගයේ වෙළඳාම් කටයුතු වලදී ආනයන සහ අපනයන කල භාණ්ඩ 2 බැගින් ලියන්න.

ii. "කඩවත්" යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

iii. උඩරට රාජධානියේ කර්මාන්ත වලටද වැදගත් තැනක් ලැබිණි. උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.